**රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය - 2021**

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 13 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගම් පනතින් සංශෝධිත රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥා පනතේ (283 අධිකාරය) 18(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංගමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

## 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පැහැර හැර තිබුණු සාමාජිකයින් 500 දෙනෙකුගෙන් හිඟහිටි සාමාජික මුදල් සහ හිඟහිටි ණය වාරික හා | දායක මුදල් හිඟ හිටීම්, ණය වාරික හිඟ හිටීම් සහ ණය පොළී හිඟ හිටීම් මුදල් පදනම මත ගිණුම් තබන බැවින් හිඟ හිටි ශේෂ ලෙස | හිඟහිටි සාමාජික මුදල්, ණය වාරික සහ පොලි මූල්‍ය ප්‍රකාශනවල |

| | | |
|---|---|---|
| ණය පොළී වශයෙන් එකතුව රු.32,980,807 ක හිඟහිටි ශේෂ පැවතුණි. එම හිඟහිටි ශේෂ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදු නොකරයි. ඉදිරියේදී සියළු ගිණුම් උපචිත පදනමට සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) ගිණුම් ප්‍රතිපත්ති අංක 3(1) අනුව පොලී ආදායම මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළ රු.6,815,743 ක පොලී ආදායමක් ලැබිය යුතුව තිබුණත්, එම ආදායම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පොලී ආදායම මුදල් පදනමට ගිණුම් තබන බැවින් හිඟ හිටි ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදු නොකරයි. ඉදිරියේදී සියළු ගිණුම් උපචිත පදනමට සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ලැබිය යුතු පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) 2021 අප්‍රේල් 20 දින මුදල් කමිටුව විසින් ණයගැතියන් 13 දෙනෙකුගේ එකතුව රු.402,499 ක ණයගැති ශේෂ කපා හැරීමට නිර්දේශ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ණයගැතියන්ගෙන් 07 දෙනෙකුගේ එකතුව රු.175,404 ක ණය ශේෂ පමණක් බොල්ණය ලෙස කපා හැර තිබුණි. | මුදල් කමිටුව නිර්දේශය මාසික කළමනාකරණ කමිටුව මඟින් අනුමත වූ පසුව එම තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව එම ණය ගැතියන්ගෙන් හත් දෙනෙකුගේ ණය ශේෂ වශයෙන් රු.175,403.77 ක් පමණක් කපා හැරීමට එම වර්ෂයේදී මාසික කළමනාකරණ කමිටුව අනුමැතිය දී ඇති බැවින් එම මුදල කපා හැර ඇත. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ අයකර ගැනීමට නොහැකි ණයගැති ශේෂ විධිමත් පරිදි කපාහැරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) පාලක මණ්ඩල පත්‍රිකා අංක 136/21/04 අනුව ඉල්ලා අස්වූ සාමාජිකයින් 08 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.474,367 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් ගත කර නොතිබුණි. | පාලක මණ්ඩල පත්‍රිකා අංක 136/21/04 අනුව ඉල්ලා අස් වූ සාමාජිකයන්ට ගෙවිය යුතු ශේෂ අදාළ සාමාජික ගිණුම් තුළම ඇතුළත්ව ඇති අතර එය වෙනම ගිණුමක් යටතේ පෙන්නුම් කිරීමක් සිදු නොකරයි. | සංගමයෙන් ඉල්ලා අස්වූ සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) සමාලෝචිත වර්ෂය අවසනයට හිඟ සාමාජික මුදල් හා හිඟ ණය වාරික වශයෙන් එකතුව රු.26,165,743 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණු අතර, එම හිඟ මුදල් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකරන බවට වන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | දායක මුදල් හිඟ හිටීම්, ණය වාරික හිඟ හිටීම් සහ ණය පොළී හිඟ හිටීම් මුදල් පදනම මත ගිණුම් තබන බැවින් හිඟ හිටි ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදු නොකරයි. ඉදිරියේදී සියළු ගිණුම් උපචිත පදනමට සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | සංගමය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී යොදා ගනු ලබන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු.85,185,156 ක් ලෙස දක්වා තිබුණි. එම වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දේපල පිරියත හා උපකරණවල භෞතික පැවැත්ම පිළිබඳ සමීක්ෂණයක් ඉදිරියේදී සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | සංගමයේ භෞතික වත්කම්වල පැවැත්ම තහවුරු කිරීමට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (උ) විවිධ පාර්ශවවලින් එකතුව රු.335,729 ක් වටිනා චෙක්පත් සංගමය වෙත ලැබී තිබුණු අතර, 2021 දෙසැම්බර් 31 දින වන විට එම චෙක්පත් කල් ඉකුත් වී තිබුණි. එසේ අවලංගු වූ චෙක්පත්වලින් නිරූපනය වූ ණයගැතියන් නැවත ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | එම නිෂ්කාශණය නොවූ චෙක්පත් ගිණුම්වලින් ඉවත් කර ඒ සඳහා නව චෙක්පත් ගෙන්වා ගැනීමට හෝ දින දීර්ඝ කරවා ගැනීමට කටයුතු කරමින් පවතී. | අවලංගු කළ චෙක්පත් වටිනාකම ණයගැතියන් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඌ) මිය ගිය සාමාජිකයන්ට ගෙවිය යුතු දායක මුදල් ගිණුමේ ශේෂය රු.19,421,207 ක් වු අතර එම ශේෂයයට අදාළ කේවල ශේෂ ලැයිස්තුව හා එහි කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ගිණුම තුළ මිය ගිය සාමාජිකයන්ට ගෙවිය යුතු දායක මුදල් හා පොලිය පමණක් නොව ඉල්ලා අස් වූ හා දායක මුදල් ලබා ගන්නා [6(a)1] සාමාජිකයන්ගේ දායක මුදල් හා පොලිය ඇතුළත් වේ. එහි කාල විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. | මියගිය සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් සඳහා කේවල ශේෂ ලැයිස්තු සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (එ) සමාලෝචිත වර්ෂයේදී සාමාජිකයින් නොවන අයට (CHPA DV) යටතේ එකතුව රු.9,346,917ක් ගෙවා තිබුණි. එම ගෙවීම්වලින් එකතුව රු.8,162,535කට අදාල ගෙවීම් 252 ක් සඳහා ගෙවීම් වවුචර්වල අංක, චෙක්පත් අංක හෝ දිනයක් සඳහන් නොකර වටිනාකම් පමණක් සඳහන් කර තිබුණි. එම නිසා ගෙවීම් සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය. | වර්ග නොකළ ප්‍රේෂණ ගිණුමේ ඇතුළත් වී ඇති සාමාජික නොවන ලැබීම් අදාළ ආයතන වෙත ගෙවීමේදී, ගෙවීම් වවුචරයක් මඟින් චෙක්පතක් නිකුත් කරයි. නමුත් අදාළ සාමාජිකයා නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිව තිබී පසුව හඳුනා ගත් ලැබීම් අදාළ සාමාජික ගිණුම් වෙත සටහන් කිරීමේදී වර්ග නොකළ ප්‍රේෂණ ගිණුමෙන් ඉවත් කිරීම සඳහා යොදන සටහනක් ලෙස ගෙවීම් වවුචරයක් යොදයි. ඒ සඳහා චෙක්පතක් නිකුත් නොවන බැවින් චෙක්පත් අංකයක් සඳහන් නොවේ. | ගෙවීම් වවුචරයක් මඟින් වියදම් ගිණුම්ගත කරන බැවින්, වවුචරයේ අදාළ සියළු විස්තර ඇතුළත් කළ යුතු වීම. |
| (ඒ) ජර්නල් සටහන් මඟින් වර්ග නොකළ ප්‍රේෂණ ගිණුමට එකතුව රු.13,775,717 ක් බැර කර තිබුණු අතර එකතුව රු.5,344,881ක් හර කර තිබුණි. එම සටහන් සඳහා විධිමත් ජර්නල් සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුමේ පෙන්වා දී ඇති පරිදි ජර්නල් සටහන් මගින් බැර කර ඇති අගයට හා හර කර ඇති අගයන් වන රු.13,775,717 සහ රු.5,344,881 ට අදාළ ජ'නල් සටහන් පවතී. | මූල්‍ය ප්‍රකාශනවලට ජර්නල් සටහන් මඟින් සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ සියලුම ජර්නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඔ) 2021 දෙසැම්බර් 31 දිනට වර්ග නොකළ ප්‍රේෂණ ගිණුමේ රු.7,395,147ක ශේෂයක් පැවතුණ අතර ඒ සඳහා කේවල ශේෂවලින් සමන්විත කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වර්ග නොකළ ප්‍රේෂණ ගිණුමේ කාල විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. | වර්ග නොකළ ප්‍රේශන පිළිබඳ කේවල ශේෂ සමඟ කාල විශ්ලේෂණයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

----------------------------------

### 1.6.1 ගෙවිය යුතු මුදල්

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මියගිය සාමාජිකයින් 88 දෙනෙකුට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට මරණ ප්‍රදාන වශයෙන් එකතුව රු.4,725,000 ක් ගෙවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සාමාජිකයින් 04 දෙනෙකුට අදාළව එකතුව රු.300,000ක් පමණක් ගෙවා තිබුණි. | සාමාජිකයෙකුගේ මරණය වාර්තා වී මාස 2ක් ඇතුළත ඔහුට හිමි ප්‍රදාන ගෙවීමට කටයුතු කරන අතර එසේ ගෙවීමට නොහැකි වී ඇති ප්‍රදාන වාර්තා වන්නේ අදාළ දීමනා හිමිකරුවන් විසින් අවශ්‍ය ලේඛනවල මුල් පිටපත් නිසි පරිදි ඉදිරිපත් නොකිරීම සහ මුදල් ලබා ගැනීමට අදාළ රිසිට්පත් නිසි පරිදි ඉදිරිපත් නොකිරිම හේතුවෙනි. සාමාජිකයින් නිසි පරිදි දැනුවත් කර අදාළ ගෙවීම් කඩිනම් කිරීමට කටයුතු කරමින් පවති.<br>පැරණි සාමාජිකයින්ගේ වැන්දඹුවන් හා දරුවන් බොහෝ දෙනා විදේශ රටවල පදිංචිකරුවන් බව හඳුනාගෙන ඇති අතර ,ඔවුන්ගෙන් ඉහත ලියකියවිලි ලබා ගැනිම දුෂ්කර කාර්යයකි. මෙම ප්‍රමාදවීම අවම කර ගැනීම සඳහා උරුමකරුවන් නම් නොකරන ලද සාමාජිකයින් වෙත උරුමකරුවන් නම් කිරීමේ පෝරම නිකුත් කිරීම සිදු කරමින් පවතී. | සංගමයේ සාමාජිකයන්ගේ ජීව දත්ත යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

අනුකූල නොවූ අවස්ථාව පහත සඳහන් වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1891 අංක 5 දරන අඥා පනතේ 21 වගන්තිය අනුව | නව රීති හා සංශෝධිත රීති වාර්ෂික මහා සභාවේ අවම වශයෙන් 2/3 බහුතර සාමාජික ඡන්දයෙන් සම්මත කරගත යුතුය. නමුත් සෑම මහා සභාවකදීම 2/3 බහුතරය ඇතැයි යන පදනමින් සංශෝධන අනුමත කරගෙන ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් 31 දිනට සංගමයේ සාමාජික සංඛ්‍යාව 14,384ක් වී තිබුණ ද, 2019 වර්ෂයේ මහා සභා රැස්වීමට සාමාජිකයින් 1,903 දෙනෙකු පමණක් සහභාගි වී තිබුණි. | වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වෙන දිනය පිළිබඳව අවස්ථා දෙකකදී පුවත්පත් මඟින් ප්‍රසිද්ධියට පත් කරන අතර, සෑම සාමාජිකයෙකුටම වාර්ෂික වාර්තාව තැපැල් කිරීම මඟින් ද දැනුවත් කිරීමක් සිදුකෙරේ. එසේම වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට සතියකට පමණ පෙර කෙටි පණිවිඩයක් (SMS) මඟින් සෑම සාමාජිකයෙකුම දැනුවත් කරයි. එසේම රැස්වීමට සහාභාගි වන සෑම සාමාජිකයෙකුම ප්‍රවාහන දීමනාවක් ද ලබා දීම මඟින් වැඩි සාමාජික ආකර්ෂණයක් අපේක්ෂා කරනු ලබන අතර, එමගින් සාමාජිකයින්ගේ සහභාගීත්වය වැඩිකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරනු ලැබේ. පැමිණ සිටි සාමාජිකයින්ගේ බහුතර කැමැත්ත මත යෝජනා සම්මත කිරීම සිදු කරනු ලැබේ. වාර්ෂික මහා සභාව පැවැත්වීමට අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව 60 කි. | සංගමයේ මහා සභා රැස්වීම් සඳහා උපරිම සාමාජික සංඛ්‍යාවක් සහභාගි කර ගත යුතුවීම. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 64,333,050ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 53,976,946 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,356,104ක වර්ධනයක් සමාලෝචිත වර්ෂයේ දී නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන පොලී ආදායම ඉකුත් වර්ෂයට වඩා සියයට 67ක වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිසියම් දිනකට සමස්ථ හිඟ ණය වාරික හා පොළිය වෙන් වෙන්ව ලබා ගත හැකි වන පරිදි ගිණුම් මෘදුකාංග පද්ධතිය වැඩි දියුණු කර නොතිබුණි. | පරිගණක මෘදුකාංග පද්ධතිය තුළ හිඟ ණය මුදල්, වාරික හා පොළිය වෙන් වෙන්ව හඳුනා ගැනීම සඳහා පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුවීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී නව සාමාජිකයන් 374 දෙනෙක් සංගමයට ඇතුළත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදි සාමාජිකයින් 198 දෙනෙක් ඉල්ලා අස්වි තිබුණු අතර, තවත් සාජිකයින් 101 දෙනෙක් මිය ගොස් තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සාමාජික සංඛ්‍යාව ශුද්ධ වශයෙන් සාමාජිකයින් 75 දෙනෙකුගෙන් සාමාජික සංඛ්‍යාව වැඩි වි තිබුණි. | පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් නව බඳවා ගැනීම් වල අඩුවීමක් සිදු වි ඇත. ඉදිරියේදී විවිධ ප්‍රවර්ධන වැඩසටහන් මඟින් සාමාජික සංඛ්‍යාව වැඩි කර ගැනීමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | සංගමයේ සාමාජික සංඛ්‍යාව වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ)සමාලෝචිත වර්ෂයේදි පාලන කමිටු රැස්විම් වාර 13ක් පවත්වා තිබුණු අතර එම කමිටු සමාජිකයින් අතර සාමාජිකයින් දෙදෙනෙකු විසින් පිළිවෙලින් රැස්විම් වාර 9 ක් හා 6 සඳහා සහභාගී වි නොතිබුණි. එමෙන්ම මුදල් විගණන හා ගෙවීම් කමිටුවේ රැස්වීම් වාර 12 ක් පැවැත්විමට | 1891 අංක 5 දරන ආඥා පනතෙහි සංශෝධිත 474 පොදු අධිකාරියෙහි 4:3 වගන්තියට අනුව පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකර අඛණ්ඩව මාසික කළමනාකරණ කමිටු වාර 3 කට නොපැමිණෙන කමිටු සභික නිලධාරීන්ගේ ධූරය අවලංගු වන බව දක්වා ඇත. | කමිටු රැස්වීම් සඳහා කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වය නිසි පරිදි සිදුවිය යුතු අතර සැලසුම් කර පරිදි රැස්වීම් වාර පැවැත්වීමට කටයුතු කළ යුතුවීම. |

| | |
|---|---|
| සැලැසුම්කර තිබුණත්, රැස්වීම් වාර 06 ක් පමණක් පවත්වා තිබුණි. | එබැවින් 2022.03.30 වන දින පැවති මාසික කළමනාකරණ කමිටුවේදී තීරණය කළ පරිදි අඛණ්ඩව ප්‍රධාන කළමනාකරණ කමිටු 3 කට සහභාගී නොවූ ඩබ්.ඒ.ඩී.ෆොන්සේකා මහතාගේ ධූරය අවලංගු කිරීමට කටයුතු කටයුතු කරන ලදී. කමිටු සභික ඩී.එච්.විජේතිලක මහතා එසේ අඛණ්ඩව කමිටුවාර තුනකට සහභාගි නොවීමක් සිදු වී නොමැත.<br>2021 වර්ෂයේ රට තුළ පැවති කොවිඩ් වසංගත රෝග තත්ත්වය හේතුවෙන්, නිලධාරීන් සහභාගී කරවීමට තිබූ අපහසුතාවය හේතුවෙන් සැලසුම් කළ පරිදි කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 32 දෙනෙක් වූ අතර ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුර අවශ්‍ය වුවහොත් බඳවා ගැනීමේ පදනම මත පුරප්පාඩුව පැවැතුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර ඇතිකර, අවශ්‍ය වුවහොත් පිටතින් සුදුසුකම් ලත් නිලධාරියෙකු බඳවා ගැනීමටත් 2020.08.28 වන දින කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. එම පුරප්පාඩුව පිරවීමේ අවශ්‍යතාවය සම්බන්ධව කළමනාකරණ කමිටුව විසින් මෙතෙක් තීරණයක් ගෙන නොමැත. | අභ්‍යන්තර විගණන තනතුරු සඳහා බඳවා ගැනීමේ අවශ්‍යතාව සලකා බලා බඳවා ගැනීමට කටයුතු කළ යුතුවීම. |